**ජල සම්පත් මණ්ඩලය - 2018**

--------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජල සම්පත් මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------------

| විගණන නිරීක්ෂණ<br>--------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>---------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| මණ්ඩලයේ තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය වුවත් රත්මලාන ගබඩාවේ තොග නිකුත් කිරීමේ දී එම ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | තොග අගය කිරීමේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයෙහි පවතින අඩුපාඩු මගහරවාලීමට කටයුතු කරනු ලැබේ. විශේෂයෙන්ම ඉක්මනින් නිකුත් වන ඉන්ධන, ලිහිසි තෙල්, පීවීසී වැනි පාරිභෝජන ද්‍රව්‍ය වල තොග ශේෂ තක්සේරු කිරීමේදී මෙවැනි තත්වයන් හටගෙන ඇත. | තොග අගය කිරීමට නිවැරදි ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|
| රත්මලාන ගබඩාවේ තිබුණු රු.564,057 ක් වූ වයර්වල තොගය සහ රු.104,208 ක් වූ ලිහිසි තෙල් තොගය ගිණුම්වල දක්වා නොතිබුණි. තවද ලිහිසි තෙල් හා ග්‍රීස් අයිතම 10 ක භෞතික ශේෂය හා තොග ලෙජර්වල ශේෂය අතර රු.135,447 ක වෙනසක් නිරීක්ෂණය විය. | තොග ගණනය කිරීමේදී සිදුව ඇති දෝෂ 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. භෞතික ශේෂය හා තොග ලෙජර් වල ශේෂ අතර වෙනසක් වර්ෂ අවසාන තොග සමීක්ෂනයේදී හඳුනාගෙන නොමැති අතර, මේ පිළිබඳව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කර පවතින දුර්වලතා හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තොග අගය කිරීම නිවැරදි ලෙස කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ වටිනාකම වූ රු.26,855,874 කින් රු.7,272,211 ක් වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ අතර වර්ෂයට වඩා පැරණි ණය ශේෂවලින් රු.737,044 ක් 2019 ජුනි 07 දින වන විටද අය වී නොතිබුණි | වසරකට වඩා කල්ගත වූ ණයගැති ශේෂ අයකර ගැනිමට කටයුතු කරමින් පවති. | ණය ශේෂ අයකර ගැනීම යාවත්කාලීනව සිදු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුද්ගලයින් සහ ආයතන 156 කින් විවිධ සේවාවන් ඉටුකර දීම සඳහා ලැබුණු රු.36,330,490 ක් වූ සේවා අත්තිකාරම්වලින් රු.17,674,325 ක් වර්ෂයක කාලයක් ඉක්ම වී තිබුණු අතර එම වර්ෂයක කාලයක් ඉක්ම වූ ශේෂයෙන් රු.9,247,612 ක් වූ සේවා අත්තිකාරම් මුදල් සඳහා අදාළ කාර්යයන් ඉටුකර දීමට 2019 ජූනි 30 දින වන විටද මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | 2018.12.31 දිනට පැවති සේවා අත්තිකාරම් ශේෂයෙන් වසරකට වඩා ඉක්මවූ ශේෂය 2019.06.30 දින වන විට රු. 9,247,612 ක් දක්වා අඩු වී ඇති අතර, එම ශේෂයන්ද ඉක්මනින් නිරවුල් කිරීමට අවධානය යොමු කර තිබේ. | ඉටුකිරීමට භාරගත් සේවාවන් කඩිනමින් ඉටුකර ලබා ගත් අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 14(1) වගන්තිය සහ 1999 අංක 42 දරන සංශෝධිත පනතේ 03 වගන්තිය | (i) සංශෝධිත පනත ප්‍රකාරව 18 ගෙන් යුක්ත උපදේශක කමිටුවක් පිහිට විය යුතු වුවද ඊට පටහැනිව 13 ගෙන් යුක්ත උපදේශක කමිටුවක් පිහිටුවා තිබුණි. | ඉදිරි කමිටු රැස්වීම් වලදී මේ පිළිබඳව අවධානය යොමු කිරීමටත් වර්තමානයට ගැලපෙන පරිදි පනත සංශෝධනය කිරීමටත් අවධානය යොමු කර තිබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | | (ii) පනතේ 12(1) වගන්තියට පටහැනිව පාරිසරික බලපෑම් පර්යේෂණ අධ්‍යයනය සඳහා රු.148,662,259 ක් වැයකර තිබුණි. | පනත ප්‍රකාරව පාරිසරික බලපෑම් පර්යේෂන අධ්‍යයන වාර්තා අන්තර් දෙපාර්තමේන්තු උපදේශක කමිටුව වෙත යොමු කර අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු යොදනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ IV වැනි පරිච්ඡේදයේ 3.2 වගන්තිය | අනියම් හෝ ආදේශක නිලධාරියෙකු බඳවා ගැනීමේ දී නිසි පරිදි බලය ලබා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙහෙයුම් කටයුතු අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා මෙම බඳවා ගැනීම් සිදු වී ඇති නමුත්, මේ වන විට අනුමත කාර්ය මණ්ඩලයට පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත. | අනුමැතිය ලබා ගෙන ඉන්පසුව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 316 සහ 341 | | මණ්ඩලයේ ප්‍රයෝජනය පිණිස ලබාගෙන තිබෙන උපයෝගී තොග පොත් වර්ග 05 ක් මුදල් රෙගුලාසි 316 හා 341 ක ප්‍රකාරව රත්මලාන ගබඩාවේ ආරක්ෂිතව ගබඩා කර නොතිබුණි. | මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ලබාගෙන තිබෙන උපයෝගී පොත් ආරක්ෂිතව ගබඩා කිරීමටත්, ඒවා නිකුත් කිරීමේ කටයුතු විධිමත් කිරීමටත්, කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය | (i) | කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං සඳහා සහ වානිජමය කෘෂිකාර්මික කටයුතු සඳහා, කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදි කරනු ලබන නළ ළිං ඉදිකිරීම සඳහා ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | භූගත ජලය භාවිතා කර සිදු කරනු ලබන කර්මාන්ත, මණ්ඩලයේ ලියාපදිංචි වී ජල ධාරිතා පරීක්ෂන සිදු කර ගැනීමටත්, ජල මනු සවි කිරීමටත් ප්‍රසිද්ධ දැන්වීම් පල කරන ලද අතර, ලියාපදිංචි කිරීමේ කටයුතු විධිමත්ව සිදු කිරීමට ක්‍රියා කරනු ලැබේ. | නළ ළිං ඉදිකිරීමට පෙර අදාළ අනුමැතිය ලබා දීමේ ක්‍රියාපිළිවෙත විධිමත්ව හා කාර්යක්ෂම කළ යුතුය. |
| | | (ii) | නළ ළිං ඉදි කිරීමේ නියැලෙන සියළු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් එසේ ලියාපදිංචි වී නොතිබුණි. | නළ ළිං ඉදිකිරීමේ නියැලෙන ආයතන ලියාපදිංචි වීම සඳහා පුවත්පත් දැන්වීම් පල කරන ලද අතර, දැනට ආයතන 190 ක් ලියා පදිංචි වී ඇති අතර, එමගින් විදුම් යන්ත්‍ර 198 ක් විදුම් කටයුතු සඳහා සුදුසු යැයි හදුනා ගන්නා ලදි. | ලියා පදිංචි කිරීමේ කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| | | (iii) | වානිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා සියළුම ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධ තත්ත්ව | මණ්ඩලයේ ලියා පදිංචි වන ලෙසට පුවත්පත් දැන්වීම් පල කරන ලද අතර, මේ වන විට ආයතන 294 ක් ලියා පදිංචි වී ඇති අතර, ජල ධාරිතා පරීක්ෂණ සිදුකර ජල මනු සවි කිරීමේන් ජල ප්‍රභවය සම්බන්ධ සිදු වන | ජල තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා අධීක්ෂණය කිරීම විධිමත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වාර්තා මණ්ඩලයෙන් නිකුත් කර නොතිබුණි. | නියාමන කටයුතු දැනට සිදු කරගෙන යමින් පවති.ඉහත තත්වයන් ඉටු කිරීමේදී දැනට පවතින නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් පනත සංශෝධනය කිරීමට මේ වන විට අවධානය යොමු කර තිබේ. | |
| (ඉ) | 2010 දෙසැම්බර් 10 දිනැති අංක 01/2010 දරන වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව සේවා කාලය අවුරුදු 12 ක් සම්පූර්ණ නොවූ අභ්‍යන්තර විගණක සඳහා සහනදායී මෝටර් බලපත්‍රයක් ලබා දී තිබුණි. | අදාල නිලධාරියා විසින් ලබා දී ඇති ලිපි ලේඛන අනුව අවුරුදු 12 ක විධායක මට්ටමේ තනතුරක සේවය කර ඇති බැවින් සහනදායී මෝටර් රථ බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු සලස්වන ලදි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවකයින් බඳවා ගැනීමේ දී චක්‍රලේඛයට පටහැනිව කටයුතු කර තිබුණි | කාර්ය මණ්ඩලය හා බඳවා ගැනීමේ පටිපාටි සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2012 ජනවාරි 18 දිනැති අංක DMS/G2/15/04 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2012 ජනවාරි 18 දිනැති අංක DMS/G2/15/04 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව අනුමත කාර්යමණ්ඩලය නිලධාරින් 16 දෙනෙකුගෙන් වැඩි කර තිබුණි. | කාර්ය මණ්ඩලය හා බඳවා ගැනීමේ පටිපාටි සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති කාර්යමණ්ඩලය පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.33,658,000 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 6,943,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 26,715,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.12,250,000 කින් වැඩි වී වර්ෂයේ වියදම රු.14,465,000 කින් අඩු වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී වෙනත් මෙහෙයුම් වියදම් රු.7,868,000 කින් වැඩි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 77 ක අගයක් ගෙන තිබුණි. වත්කම් ඉවත් කිරීමේ අලාභය (Losses on Disposals), බොල් ණය (Bad Debts), දඩ සහ අධිභාර (Fines & Surcharges) වැඩි වීම ඊට හේතු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාත වර්ගය | 2018 | 2017 |
|---|---|---|
| **ද්‍රවශීලතා අනුපාතය** | | |
| ජංගම අනුපාතය | 6.25:1 | 2.79:1 |
| ක්ෂණික අනුපාතය | 3.16:1 | 0.92:1 |

මණ්ඩලය විසින් එහි මෙහෙයුම් කටයුතු වල ස්වභාවය අනුව තිබිය යුතු සුදුසු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ ඇගයීමක් කර සුදුසු කාරක ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ දී ජංගම වගකීම් 1 ක් පියවීම සඳහා ජංගම වත්කම් 6.25 ක් පවත්වාගෙන තිබුණි. මෙම හේතුව නිසා රු.මිලියන 218 ක් විශ්ලේෂණය කිරීමකින් තොරව ජංගම වත්කම්වල ආයෝජනය කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාව මණ්ඩලය පිළියෙල කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකමට අදාළ මූල්‍ය කාර්යසාධනය එම වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකමට අදාළ මූල්‍ය කාර්ය සාධනය වෙන වෙනම ගණනය කිරීම, ක්‍රියාකාරකම් කිහිපයක් එකිනෙකට සමගාමීව සිදු කිරීම නිසා අපහසු වී ඇත. මේ පිළිබඳව තවදුරටත් අවධානය යොමු කොට විධිමත් කිරීමට කටයුතු යොදනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය කාර්යසාධනය පෙන්නුම් කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල සම්පත් මණ්ඩලය භාවිතා කරන ප්‍රධාන කාර්යාල භූමිය , වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් රත්මලාන යාන්ත්‍රික වැඩපල පිහිටි භූමිය හා රජයට අයත් අනුරාධපුර අලුත්නුවර පිහිටි සංචාරක නිවාසය අයත් භූමිය මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒවායේ පිහිටි ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමට රු. මිලියන 20.3 ක් වැය කර තිබුණි. | රජයට අයත් භූමි භාගයන්හි පවත්වාගෙන යනු ලබන මණ්ඩලයේ කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමට අවශ්‍ය වන විට ඒ සඳහා කටයුතු යෙදවීමට සිදු වී ඇත. එම ඉඩම් මණ්ඩලයේ නමට පවරා ගැනීමට උත්සාහ දරනු ලැබුවද, ඒ සඳහා කටයුතු සලස්වා ගැනීම අසීරු වී ඇත. විශේෂයෙන්ම රත්මලාන ප්‍රධාන වැඩබිම් සංකීර්ණයේ වහලය වසර 100 ක් පමන තරම් පැරණි හා අනතුරුදායක තත්වයක වූ අතර එහි ගබඩාවේ සාමාන්‍යයෙන් රු.මිලියන 150 කට වැඩි තොග පවත්වා ගැනීමත් හා අනිකුත් යාන්ත්‍රික උපකරණ වල ආරක්ෂාවත් වෙනුවෙන් වේලී ආරක්ෂන ව්‍යාපෘතිය යටතේ මෙහි වහලය අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රාග්ධන වියදමක් දරන ලදි. | මණ්ඩලය භාවිතා කරන බාහිර ආයතන සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මොනරාගල පලාත් කාර්යාල පරිශ්‍රය තුල වටිනාකම තීරණය නොකළ ජල ටැංකි රඳවන හා ප්ලාස්ටික් ජල ටැංකි 21 ක් තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවලද දක්වා නොතිබුණි. | නියඟයන් පවතින අවස්ථාවන්හිදී ජල සැපයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන මෙම ජල ටැංකි භාණ්ඩ වට්ටෝරු ලේඛනවල ඇතුලත් කිරීමට මේ වන විට කටයුතු කර ඇති අතර, ඒවායේ වටිනාකම් තක්සේරු කර පොත් වලට ගැනිමටත් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | සියළුම වත්කම් හඳුනාගෙන වටිනාකම ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 මැයි මස මිලදී ගන්නා ලද රු.8,941,250 ක් වූ ජල පොම්ප 50 කින් 2019 ජූලි වන විට 06 ක් පමණක් භාවිතයට ගෙන තිබුණි. භාවිතා නොකළ ජල පොම්ප 44 ක වගකීම් කාලය වූ වර්ෂ 02 ඉක්මවා තිබුණි. | හදිසි ආපදා හා ගංවතුර තත්වයන්හිදී ප්‍රයෝජනයට ගැනීම පිනිස මෙම ජල පොම්ප මිලදී ගෙන ඇති අතර, එවැනි අවස්ථාවකදී භාවිතයට ගැනීම සඳහා ඒවා සුදානම් කර තිබේ. | අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව මිලදී ගැනීම් කළ යුතුය. |
| (ඈ) | 2018 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.2,638,900 ක් වූ විදුලි ජනක යන්ත්‍ර 11 ක් සහ රු.2,250,000 ක් වූ විදුලි ජනක යන්ත්‍ර 03 ක් 2019 ජූලි වන විට ද නිෂ්ක්‍රීයව පැවතුණි. | හදිසි ආපදා හා ගංවතුර තත්වයන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා විදුලි ජනක යන්ත්‍ර තබා ගැනීමට කටයුතු කර තිබේ. | අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව මිලදී ගත යුතු අතර ඒවා භාවිතයට ගන්නේනම් පමණක් මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ඉ) | 2009 වර්ෂයේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු ජල පොම්ප 50 ක් භාවිතා කිරීමකින් තොරව සහ එම යන්ත්‍රවල සක්‍රිය බව හෝ අක්‍රිය බව පරීක්ෂා කිරීමකින් තොරව ගබඩාවේ නිශ්කාර්යව රඳවාගෙන තිබුණි. | සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබුනු ජල පොම්ප විවිධ ගංවතුර අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගනු ලැබ ඇති අතර, ඒවායෙහි ක්‍රියාකාරී බව පරීක්ෂා කර භාවිතයට ගත නොහැකි ඒවා වෙතොත් අපහරණය කිරීමට මෙම වසරේදී අවධානය යොමු කරනු ලැබේ. | භාවිතයට ගැනීම හෝ අවශ්‍යතාවයක් නොමැතිනම් හා භාවිතයට ගත නොහැකි නම් වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | රිග් අංක 03 දරන විදුම් යන්ත්‍රයේ රාජකාරී ඉටුකළ නිලධාරියා 2018 අගෝස්තු 01 දින විශ්‍රාම ගිය පසු පුහුණු නිලධාරියෙකු නොමැති වීම හේතුවෙන් එම යන්ත්‍රය සහ ඊට අදාළ සියළු උපකරණ රත්මලාන යාන්ත්‍රික වැඩපලේ නිශ්ක්‍රීයව පැවතුණි. | මණ්ඩලයේ විදුම් යන්ත්‍ර ක්‍රියාත්මක කරවීම සඳහා පුහුණුවලත් විදුම් නිලධාරීන් දැනට මණ්ඩලය සතුව සිටින අතර, අංක 03 දරන විදුම් යන්ත්‍රයෙහි පවතින අළුත්වැඩියා කටයුතු සඳහා රත්මලාන වැඩ බිමට යවා ඇත. | අළුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්මලාන ප්‍රධාන ගබඩාව සහ යාන්ත්‍රික වැඩපලට අනුමත සේවක සංඛ්‍යාව 89 ක් වුවත් තත්‍ය සේවක සංඛ්‍යාව 48 ක් වී තිබුණි. යාන්ත්‍රික ඉංජිනේරු ඇතුළු තනතුරු 41 ක් පුරප්පාඩුව පැවතුණි. සේවක සංඛ්‍යාවෙන් 28 දෙනෙකු සඳහා රාජකාරි ලැයිස්තු ලබා දී නොතිබුණි. | රත්මලාන ප්‍රධාන ගබඩාවට සහ යාන්ත්‍රික වැඩපලට අනුයුක්තව සිටිය යුතු සේවක සංඛ්‍යාවෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා මේ වන විට භාණ්ඩාගාර අනුමැතියට යොමු කර තිබෙන හෙයින් ඒ අනුව බඳවා ගැනිම් සිදු කිරිමට ඉක්මනින් අපේක්ෂා කෙරේ. රාජකාරි ලැයිස්තු නිකුත් කිරිමට අවශ්‍ය උපදෙස් ද ලබාදෙන ලදි. | පුරප්පාඩුවලට බඳවා ගැනීමට කටයුතු කළ යුතු අතර රාජකාරී ලැයිස්තු ද ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සේවක සංඛ්‍යාව 119 ක් විය. අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | මණ්ඩලයේ දැනට පවතින පුරප්පාඩු වලින් තනතුරු 106 ක් පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත. | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. |

# 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුව ද එලෙස කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019.04.23 වන දින ජාතික විගණන කාර්යාලය වෙත භාරදී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය වෙත ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් අතර සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක සහ අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර අතර සියයට 5 සිට සියයට 175 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | අයවැයගත ආදායම් හා වියදම් සත්‍ය අගයන් හා අතර ඇතිවන විචලනයන් හැකිතරම් දුරට අවම කරගැනීමට ඉදිරියේදී අවධානය යොමු කරනු ලැබේ. | අයවැය ලේඛනය තාත්විකව පිළියෙල කර අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සලකා බලා ජල සම්පත් මණ්ඩලය විසින් සිය විෂය පථයට අනුව ලගා කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණක් වන සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම, ඒවායේ තිරසාර කළමනාකරණය සහතික කිරීම සහ එහි විෂය පථයට ගැනෙන අනෙකුත් අරමුණු හදුනාගෙන තිබුණ ද, ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්කය ලඟා විය යුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සදහා වන දර්ශක ද හදුනාගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන වාර්ෂික සංධිස්ථාන හදුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව ජල සම්පත් මණ්ඩලය විසින් ලඟා කරගත් අරමුණු ප්‍රධාන වශයෙන් භූගත ජල සම්පත් දීප ව්‍යාප්තව සංවර්ධනය කිරීම, සංරක්ෂණය සහ කළමනාරණය සහතික කිරීම පදනම් වූ අතර, පසුගිය වර්ෂයන්හි මණ්ඩලයේ අත්දැකීම් සහ ඒ සම්බන්ධ ඉලක්ක පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමට අදාළ අතර මැදි ඉලක්ක මෙන්ම, ප්‍රධාන ප්‍රගති දර්ශක ( KPI) ද, මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් වලට ඇතුළත් කොට ඒ අනුව අදාළ ව්‍යාපෘති සිදුකරගෙන යනු ලැබේ.මෙම කටයුතු තවදුරටත් විධිමත් කිරීමට විගණනය මඟින් පෙන්වා ඇති පරිදි කටයුතු කරනු ලැබේ. මේ සඳහා අත්‍යවශ්‍ය භෞතික සහ මානව සම්පත් සපුරාගැනීමටද ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන අරමුණු හදුනාගෙන ඒ හා සම්බන්ධ ඉලක්ක, දත්ත ඉලක්ක ලගා විය යුතු සංසිද්ධි මැන බලන දර්ශක නිවැරදිව හදුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන පාර්ශවයන් හඳුනාගෙන තිබුණ ද ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදි සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. | මණ්ඩලයේ කාර්යභාරය හා සම්බන්ධ පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල පාර්ශවයන් සමඟ මණ්ඩලය නිරතුරුවම කටයුතු කරන අතර, මණ්ඩලයේ කාර්යභාරය සැලසුම් කිරීමේදී විශේෂයෙන්ම වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ලබාදෙන උපමාණ වලට අනුකූලව කටයුතු යොදනු ලැබේ. තවද, ජල සම්පත් මණ්ඩල පනතට අනුකූලව අවශ්‍ය රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය පිණිස යෝජිත අන්තර් දෙපාර්තමේන්තු උපදේශක කමිටු 2017 වසරේ සිට රැස් කිරීමට කටයුතු යොදා ඇත. | තිරසාර සංවර්ධනය උදෙසා සහභාගීත්ව ප්‍රවේශය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව දැඩිව අවධානය යොමු කොට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ලැබේ. මීට අදාලව දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු යොදනු ලැබේ. | තිරසාර සංවර්ධනය සඳහා ලඟා වීමට අදාළ වන දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම කළ යුතුය. |